පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

02 වන වාරය, ජුලි 04 වන සතිය

සැකසුම -එස්.එස්.සී.ජයසූරිය

# සති පාසල කාර්‍ය පත්‍රිකාව

**1. නිපුණතාව 4.0 :** නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසාංගික ලක්ෂණ හඳුනා ගනියි.

**පාඩම :** දේශීය නාට්‍යය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර අවස්ථා අධ්‍යයනය

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්‍යයන්:

- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- යුගාසන බණ සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කිරීම.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **කියවීම් පත්‍රිකාව -**

**යුගාසන බණ**

එකම ධර්ම ශාලාවක වැඩ හිඳ ධර්මයෙහි කොටස් මාරුවෙන් මාරුවෙන් මාරුවට දේශනා කිරීම හෝ ප්‍රශ්නෝත්තර මඟින් දේශනා කිරීම මෙමඟින් අදහස් කෙරේ. ධර්ම ගැටලු විසඳයි අතීත කතාවක් වචන මඟින් ප්‍රතිනිර්මාණය කරන මෙම අවස්ථාව තුළ ද නාට්‍යමය අංකුර අවස්ථා දැකිය හැකිය.

- සමාරෝපය - ධර්ම දේශනා කරන භික්ෂූන් ලෙස පෙනී සිටීම.
- සංවාද භාවිතය - මාරුවෙන් මාරුවට දේශනා කිරීම හෝ ප්‍රශ්නවලට උත්තර සැපයීම.
- ආලෝකය - පන්දම් භාවිතය
- ප්‍රේක්ෂක සහභාගීත්වය - උපාසක උපාසිකාවන

## 4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:

- නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- යුගාසන බණ නම් නාට්‍යමය අවස්ථාවේ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම.

**5.ඇගයීම /තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. මෙම බෞද්ධ පූජා කර්මය කෙටියෙන් විස්තර කරන්න.
2. මෙහි ඇතුළත් නාට්‍යමය අවස්ථා උදාහරණ සහිතව ලියා දක්වන්න.

**සැකසුම :- S.S.C ජයසූරිය**

**ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය**